# නර්තනය - 7 ශ්‍රේණිය

## (පළමු වාරය )



The National e-learning Portal for the General Education

හෝමාගම අධ්‍යාපන කලාපය

ස්වයං අධ්‍යයන ඉගෙනුම් අත්වැල

නර්තනය | අංක - 5 | 7 ශ්‍රේණිය

ඒකකය :- 4.1 ජන ගායනාවල සංස්කෘතික පසුබිම

4.2 ජන ගී ගායනය

♦ 7 ශ්‍රේණියට නියමිත ජන ගායනා වර්ග

වන්නම් / තලමල වරුණ / කුලු කවි / තාලම් කවි / මල් යහන් කවි

## වන්නම් හා තලමල වරුණ කවි



උඩරට වන්නම්



තල මල

## වන්නම් පසුබිම

♦ සම්ප්‍රදායන් ත්‍රිත්වයෙහි ම වන්නම් ඇත.

♦ වන්නම යන වචනයේ අර්ථය "වර්ණනාව" යි.

♦ මුල් කාලයේ වන්නම් ගායනයට පමණක් සීමා වූ අතර පසුව නර්තනයට යොදාගෙන ඇත.

♦ වන්නමෙන් කියවෙන අදහස නර්තනයෙන් නොපෙන්වයි.

♦ වන්නම තාලානුකූලව නර්තනය කරයි.

♦ උඩරට, සබරගමු වන්නම්වල නාමික වශයෙන් සමානකම් ඇත.

උදා :- ගජගා , හනුමා , ගාහක

## වන්නම් බිහිවීම

| උඩරට | පහතරට | සබරගමු |
|---|---|---|
| වන්නම් ගණන 18 | වන්නම් ගණන 32 | වන්නම් ගණන 18 |
| විනෝදාස්වාදය මුල් කරගෙන රචනා වී ඇත. | දේව භක්තිය අපේක්ෂාවෙන් රචනා කර ඇත. | විනෝදාස්වාදය මුල් කරගෙන රචනා වී ඇත. |

## උඩරට නර්තන සම්ප්‍රදාය - තුරඟා වන්නම

- මෙම වන්නමෙන් සිදුහත් කුමරු ගිහිගෙය අතහැර කන්ථක නම් වූ අසු පිට නැඟී, අනෝමා ගංතෙරින් එතෙර වී පැවිදි බව ලබා ගැනීමට පිටත් වූ අයුරු විස්තර කරයි.
- තුරඟා යනු අශ්වයාට සමානාර්ථ පදය කි.
- 2 + 3 (සුළු මැදුම්) දෙතිතට ගායනය කරයි.

| ʌ | | / | | | ʌ | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 3 |
| දොං | - | ජිං | - | ත | ග | ත | දොං | - | ත |





බෙර පදය :- දොං ජිංත ගත දොංත

තානම :- තත් තත් තනත් තනෙන - තත් තත් තනත් තනෙන
තත් තත් තනත් තම්ද නා..... නා.....
තන තනෙන තන තනෙන තතන තම්දන තනෙන
තානත් තනත් තම්ද නා..... නා.....

කවිය 01 :- සත්වෙත් මහත් අදර ලත් යුත් සිදත් කුමරු
ගත් සිත් තොසත් පැවිදි අංගා
අණ කරන ඡන්නයෙන කන්ථකය අසු ගෙනෙන
ගෙන යෙදුණ අසුගෙ පිට නැංගා

(තානම)

කවිය 02 :- ගත් ගත් පයත් අසුගෙ ශබ්දත් වසත් සුරිඳු
යන්නෙන් තොසින් තිදෙන සමඟා
යන යනෙන කල තිදෙන එතැන තැන පසුව දැන
ගංතෙරට පත්වුණිය එමඟා

(තානම)

කවිය 03 :- ලත් ලත් සිතත් තිදෙන වෙත් වෙත් එකත් පසුව
මුත් කන්ථකත් වේ ය තුරඟා
සිදුහතුන ගෙන වහන ඡන්න වලිගය අතින
පැන්නෙන් එතෙර අනොම ගංගා

(තානම)

කවිය 04 :- ගොස් සිත් මහත් රුසිරු ලත් යුත් සිදත් කුමරු
ගෙන් සෙත් රැගත් නෙර්ත අංගා
තිදෙන පැන ගිය ගඟින එතෙද අණ ගෙන බැතින
යෙදුව නැණ වර්ණයෙන තුරඟා

(තානම)

කස්තිරම :- (කුද ගජිත කුද ගජිත කුද ගජිත කුද තා) // (දකුණට වමට)
කුද ගජිත කුද තා //
කුද තා //
කුද ගජිත කුද ගජිත කුද ගජිත කුද තා.

**<u>ක්‍රියාකාරකම</u>**

1) තුරඟා වන්නමේ තාල රූපය ............................ නම් වෙයි.
2) මුල් කාලයේ වන්නම් ....................................... සඳහා රචනා විය.
3) වන්නම් යන්නෙහි අර්ථය .................................... යන්නයි.
4) තුරඟා යනු ............................. සමාන පදය යි.
5) තුරඟා වන්නමෙහි අදහස (ප්‍රස්තුතය) ........................................................... වෙයි.

❖ තුරඟා වන්නමේ කවි කට පාඩම් කරගන්න.
❖ නියමිත තිත තබමින් තාලානුකූලව ගයන්න.

## තලමල වරුණ කවි




### සමාජ හා සංස්කෘතික පසුබිම

- ඉතාමත් අලංකාර ලෙස පිපී සොබාදහම වර්ණවත් කරන තලමල හටගැනීම අසුභ ලකුණක් බව අතීතයේ ගැමියෝ විශ්වාස කරති.
- තල් ගසේ ආයු කාලය අවසන් වන මොහොතේ තල මල පිපෙයි.
- තල මල කපා ගමෙන් ඉවතට ගෙනයාම ඉතා ගෞරව සහිත ව හිස මත තබා ගෙන හෝ ඇතු පිට තබා ගෙන ගිය බව කවිවලින් විස්තර කරයි.
- තල් පත්‍ර කේන්ද්‍ර සකස් කිරීමට යොදා ගනී.
- ගැමියන් තුළ තිබූ විශ්වාස හා ආගමික භක්තිය, විඩාව දුරු කර ගැනීමට ඔවුන් ක්‍රියා කළ අයුරු කවිවලින් විස්තර වේ.

### කවි

(3 + 4 මැදුම් මහ දෙතිත - දෝං ජිං ජිං තකට දොංතක)

(1) ලෙල දෙමිනේ මල උඩු ගුවනේ මුතු කුඩ ලෙසිනේ සුළඟට වැනුණේ
සොඳ ලෙසිනේ මිණි හරණ ලෙසේ ඈතට පෙනුණේ රන් කොත ලෙසිනේ
අප ගොසිනේ මල දැක නෙතිනේ සිත පිරිය වුණේ නිම නැති ලෙසිනේ
මෙම ලෙසිනේ තල මල පිපුණේ සකි පිය සකිනේ සොඳ ගල මුදුනේ

(2) යන්ට සොඳයි ශ්‍රී මහ බෝ අනුරපුරේ
ගොන් බැඳි රියකින් යා හැක අනුරපුරේ
සොඳට සොඳයි තලමල ඇති බරට බරේ
ඇතු පිට වඩවමු තලමල වීදිකරේ

- නියමිත තාල තබමින් කවි ගායනා කරන්න.

## <u>ක්‍රියාකාරකම</u>

- **හිස්තැන් පුරවන්න.**

1) තලමල හටගැනීම .............................. ලකුණක් බව ගැමියෝ විශ්වාස කරති.

2) තලමල පිපෙන්නේ ............................................ අවසන් වන මොහොතේ ය.

3) තලමල ගමෙන් ඉවතට රැගෙන යන ආකාර දෙකක් ලියන්න.

   1. ...................................................................................

   2. ...................................................................................

4) කේන්ද්‍ර සෑදීමට ගන්නේ තල් ගසේ .................................. ය.

5) තලමල වරුණ කවිවලින් විස්තර කරන්නේ කුමක් ගැන ද ?

   1. ...............................................

   2. ...............................................

   3. ...............................................